# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

**11 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව** | **04 ඒකකය**

- **4.1, 4.1.2, 4.2, 4.2.2, 4.3, 4.4, 4.5.1, 4.5.2, 4.6, 4.7**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නාට්‍යමය ලක්ෂණ බහුලවම දැකිය හැකි බෞද්ධ පූජාකර්මයක් වනුයේ,
   (1). දොරකඩ අස්න (2). අංගුලිමාල දමනය (3). බෝධි පූජා (4). පිරිත් පිංකම

02. උඩරට ප්‍රදේශවල රඟ දක්වනු ලබන ප්‍රධානතම ශාන්තිකර්මය වන්නේ,
   (1). මඩු ශාන්තිකර්ම (2). රටයකුම (3). සන්නියකුම (4). කොහොඹාකංකාරිය

03. කොහොඹාකංකාරියේ අනතර්ගත අංකුර නාට්‍යමය අවස්ථාවක් නොවන්නේ,
   (1). නානුමුරය (2). යක්කම් පහ (3). ගබඩාකොල්ලය (4). ගුරුගේමාලාව

04. පඬුවස්දෙව් රජුට වැළඳුණු දිවිදෝෂය සුව කිරීමට පැමිණි රජු වන්නේ,
   (1). මලෙන් උපන් පත්තිනි දේවිය (2). මව්කුසින් උපන් මලය රජු (3). මලෙන් උපන් මලය රජු (4). මව්කුසින් උපන් පත්තිනි දේවිය

05. පඬුදෙව් රජුට දිවිදෝෂය වැළඳීමට හේතුව වූයේ,
   (1). පත්තිනි දේවියගේ ශාපය (2). විජය රජුගේ ශාපය (3). කුවේණියගේ ශාපය (4). මේ කිසිවක් නොවේ

06. දෙවොල් මඩු ශාන්තිකර්මයට සම්බන්ධ රජු වන්නේ,
   (1). විජය රජු (2). සේරමානන් රජු (3). පඬුවස්දෙව් රජු (4). මහාසම්මත රජු

07. පූනාමඩු, මංගර මඩු, හැල්ලුම් මඩු අයත් නර්තන සම්ප්‍රදාය වන්නේ,
   (1). උඩරට සම්ප්‍රදාය (2). සබරගමු සම්ප්‍රදාය (3). පහතරට සම්ප්‍රදාය (4). මේ කිසිවක් නොවේ

08. දෙවොල්මඩු ශාන්තිකර්මයට අයත් නොවන නාට්‍යමය පෙළපාලියක් වන්නේ,
   (1). අඹවිදමන (2). වඩිගපටුන (3). රාමා මැරීම (4). ඇත්බන්ධන මීබන්ධන

09. ශ්‍රී ලංකාවේ රඟදක්වනු ලබන ගැමි නාටක අතරින් පැරණිතම ගැමි නාටකය වන්නේ,
   (1). කෝලම් (2). සොකරි (3). නූර්ති (4). නාඩගම්

10. උඩරට ප්‍රදේශවල රඟදක්වනු ලබන ගැමි නාටකයක් වන්නේ,

(1). සොකරි (2). කෝලම් (3). නූර්ති (4). නාඩගම්

11. සොකරි නාට්‍ය චරිතයක් නොවන්නේ,

(1). ගුරුහාමි (2). පරයා (3). පනික්කලරාල (4). වෙදරාල

12. සොකරිය හා ආඬිගුරු ශ්‍රී ලංකාවේ පැමිණි ගම් ප්‍රදේශය වන්නේ,

(1). සීනිගම ට (2). තඹරාවිට ට (3). ඌරුගම ට (4). වෙල්අස්ස ට

13. සොකරි රඟදැක්වීමේදී ප්‍රධාන වන දෙවියා වන්නේ,

(1). ගම්භාර (2). පත්තිනි (3). දෙවොල් (4). දැඩිමුණ්ඩ

14. ආඬිගුරු හා සොකරි ශ්‍රී ලංකාවට පැමිණි අරමුණ වන්නේ,

(1). ශ්‍රී ලංකාව නැරඹීමට

(2). දරුවෙකු ලබාගැනීමේ අපේක්ෂාවෙන්

(3). වැඳපුදා ගැනීමට

(4). වාසය කිරීමට

15. සොකරි නාට්‍යයේ රංග භූමිය වන්නේ,

(1). තානායම්පොළ

(2). පින්තූර රාමු වේදිකාව

(3). කමත

(4). කරලිය

16. 'කෝලම්' යන්නෙහි අර්ථය වන්නේ,

(1). වෙස්මුහුණු පැළඳ නැටීම

(2). සමයං නැටීම

(3). විනෝදය යන්නය

(4). නිශ්ඵල යන්නය

17. කෝලම් වඩාත් ප්‍රචලිත වන්නේ,

(1). උඩරට ප්‍රදේශවල

(2). වන්නි ප්‍රදේශවල

(3). පහතරට ප්‍රදේශවල

(4). සබරගමු ප්‍රදේශවල

18. කෝලම් නාට්‍යයේ ලක්ෂණයක් නොවන්නේ,

(1). සියලු චරිත පිරිමින් රඟදක්වයි

(2). සමාජයේ දුබලතා හාස්‍යයට ලක්කිරීම

(3). ස්ත්‍රී චරිත රඟදැක්වීම

(4). සියලු චරිතවල නිශ්චිත මුහුණු තිබීම

19. කෝලම් රංගභූමිය වන්නේ,

(1). වෙස්අත්ත (2). තානායම්පොල (3). මඩුව (4). කමත

20. කෝලම් රංගයේදී පූර්ව අවස්ථාවේ පැමිණෙන චරිතයක් වන්නේ,

(1). පනික්කලරාල

(2). මහාසම්මත රජු

(3). බහුබූතයා

(4). සෙල්ලම්පිල්ලෙ

21. නාඩගම් රංගභූමිය වන්නේ,

(1). මඩුව (2). කරලිය (3). තානායම්පොල (4). වෙස්අත්ත

22. ශ්‍රී ලංකාවේ රඟදැක්වූ ප්‍රථම සිංහල නාඩගම වන්නේ,

(1). බැලසන්ත (2). බුම්පෝඩි (3). රොලීනා (4). ඇහැලේපොල

23. නාඩගම් සඳහා යොදාගත් සංගීතය වන්නේ,

(1). උත්තර භාරතීය රගධාරී සංගීතය
(2). දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය
(3). උත්තර භාරතීය කර්ණාටක සංගීතය
(4). දක්ෂිණ භාරතීය රාගධාරී සංගීතය

24. මුල්ම සිංහල නාඩගම් රචකයා වනුයේ,

(1). ජෝන් ද සිල්වා
(2). සී දොන් බස්තියන්
(3). පිලිප්පු සිඤ්ඤෝ
(4). මෝදර පැලිස් අප්පුහාමි

25. නාඩගමේ ස්ථාවර පාත්‍රයෙක් නොවන්නේ,

(1). බහුබූතයා (2). හඬදූතයන් (3). සෙල්ලම්පිල්ලේ (4). රජතුමා

26. 1877 දී බොම්බායේ සිට මෙරටට පැමිණි විදේශීය පාර්සි ජාතිකයා වන්නේ,

(1). නියුමන් ජුබාල්
(2). බලිවාලා
(3). ඩන්කන් වයිට්
(4). නිකොලායි ගොගොල්

27. ඔහු විසින් මෙරට ප්‍රචලිත කරවූ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

(1). නාඩගම් (2). නූර්ති (3). මිනර්වා (4). ටීටර්

28. මුල්ම සිංහල නූර්තිය වන්නේ,

(1). සිරිසඟබෝ (2). රොලීනා (3). විදුර (4). රාමායණය

29. නූර්තිය හා බැඳුණු ප්‍රසිද්ධ රඟහල වන්නේ,

(1). ජොන් ද සිල්වා රඟහල
(2). ටවර්හොල් රඟහල
(3). ලුම්බිණි රඟහල
(4). එල්පින්ස්ටන් රඟහල

30. නූර්ති සඳහා යොදාගත් කතා වස්තූන් නොවන්නේ,

(1). දේශානුරාගය
(2). ඓතිහාසික සිද්ධීන්
(3). කාලීන සමාජ සිද්ධීන්
(4). ශෘංගාරාත්මක සිද්ධීන්

31. ශ්‍රී ලංකාවේ ජනප්‍රියම නූර්ති රචකයෙක් වන්නේ,

(1). ජෝන් ද සිල්වා
(2). එදිරිවීර සරච්චන්ද්‍ර
(3). ජෙරොම් ද සිල්වා
(4). සුගතපාල සිල්වා

32. ආදි විශ්ව විද්‍යාලීය නාට්‍ය තුළ ඉංග්‍රීසි නාට්‍ය නිර්මාණය කළ ඉංග්‍රීසි නාට්‍යකරුවා වන්නේ,

(1). ඊ. එෆ්. සී. ලුඩොවයික්
(2). නිකොලායි ගොගොල්
(3). නියුමාන් ජුබාල්
(4). බර්නාඩ් ෂෝ

- පහත වගුව ඇසුරින් 33 සිට 36 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| වෙට්ංපෝ ගොඩෝ | H | ගොඩෝඑනකං | ජේ. ඒ. සෙල්වදොරේ |
| ඇපල් කාර්ට් | බර්නාඩ් ෂෝ | ඇපල් කරත්තය | J |
| ද ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල් බ්‍රෙෂ්ට් | I | සුගතපාල ද සිල්වා |
| G | හෙන්රි ඉබ්සන් | ජන හතුරා | සුනන්ද මහේන්ද්‍ර |

33. ඉහත කොටුවේ H අක්ෂරයේ දැක්විය යුතු නම වන්නේ,

(1). බර්නාඩ් ෂෝ
(2). බර්ටෝල් බ්‍රෙෂ්ට්
(3). ප්ලෝටස්
(4). සැමුවෙල් බෙකට්

34. ඉහත J කොටුවේ ඇතුළත් විය යුතු පුද්ගලයා වන්නේ,

(1). සුනිල් විජේසිරිවර්ධන
(2). පියදාස නිශ්ශංක
(3). රංජිත් ධර්මකීර්ති
(4). සැමුවෙල් බෙකට්

35. I අක්ෂරයෙන් දැක්වෙන නාට්‍ය වන්නේ,

(1). අම්මා
(2). හුණුවටයේ කතාව
(3). දිරිය මව සහ ඇගේ දරුවෝ
(4). හිත හොඳ අම්මණ්ඩි

36. G අක්ෂරයෙන් දැක්වෙන ඉංග්‍රීසි නාට්‍ය වන්නේ,

(1). ද පබ්ලික් එනිමි
(2). ඩෝල්ස් හවුස්
(3). ද ඩ්‍රැගන්
(4). ද එල්ඩර් සන්

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් 37 සිට 42 දක්වා පිළිතුරු ලියන්න.

| නාට්‍යයේ නම | මුල් කෘතියේ රචක | පරිවර්තන/අනුවර්තන නාම | පරිවර්තන අනුවර්තන |
|---|---|---|---|
| ද කොකේසියන් | ක | ග | ජ |
| චෝක් සර්කල් | ඛ | මූදු පුත්තු | ඣ |

37. 'ක' අක්ෂරයෙන් දැක්වෙන මුල් කෘතියේ රචකයා වන්නේ,

(1). බර්ටෝල් බ්‍රෙෂ්ට්
(2). ටෙනිසි විලියම්
(3). සොෆොක්ලීස්
(4). සැමුවෙල් බෙකට්

38. 'ක' අක්ෂරයෙන් දැක්වෙන පරිවර්තන/අනුවර්තන නාට්‍ය වන්නේ,

(1). අපට පුතේ මගක් නැතේ
(2). පුත්‍ර සමාගම
(3). බෙරහඬ
(4). හුණුවටයේ කතාව

39. වගුවේ 'ජ' කොටුවෙන් දැක්වෙන රචකයා වන්නේ,

(1). බන්දුල ජයවර්ධන
(2). සුනන්ද මහේන්ද්‍ර
(3). හෙන්රි ජයසේන
(4). ධම්ම ජාගොඩ

40. ඉහත වගුවේ 'ට' අක්ෂරයෙන් දක්වෙන නාට්‍යයේ නම වන්නේ,

(1). ද සීගල් (2). යේර්මා (3). ද ෆාදර් (4). රුඩන්ස්

41. 'ඩ' අක්ෂරයෙන් දක්වෙන ඉංග්‍රීසි නාට්‍ය රචකයා වන්නේ,

(1). ගාර්ෂියා ලෝකා (3). ඇන්ටන් චෙකොෆ්

(2). බර්නාඩ් ෂෝ (4). එව්ගිනි ෂ්වාන්ස්

42. මෙහි 'ණ' අක්ෂරයෙන් සඳහන් විය යුතු නම වන්නේ,

(1). පියදාස නිශ්ශංක (3). සුගතපාල ද සිල්වා

(2). රංජිත් ධර්මකීර්ති (4). ගුණසේන ගලප්පත්ති

43. ටීටර් නාට්‍යයේ පුරෝගාමියා වනුයේ,

(1). සිරිසේන විමලවීර (3). ජෝ අබේවික්‍රම

(2). එඩී ජයමාන්න (4). මාක් ඇන්ටනි

---

## II කොටස

- **4.1 මඩු රඟ ලකුණු**

01. මඩු ශාන්තිකර්ම අයත් වන්නේ කුමන සම්ප්‍රදායේද?
02. එම සම්ප්‍රදායේ රඟ දක්වනු ලබන මඩු ශාන්තිකර්ම කිහිපයක් ලියන්න.
03. මඩු ශාන්තිකර්ම අතරින් දෙවොල් මඩු ශාන්තිකර්මයේ උපත් කතාව සැකෙවින් ලියන්න.
04. මඩු ශාන්තිකර්ම යනු කුමක්දැයි හඳුන්වන්න.
05. දෙවොල් මඩු ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාලි මොනවාද?
06. එම නාට්‍යමය පෙළපාලිවල ඇතුළත් නාට්‍යමය ලක්ෂණ මොනවාද?
07. ශාන්තිකර්ම පැවැත්වීමමේ මූලික අරමුණු මොනවාද?

- **4.2.1 සොකරි**

08. දේශීය ජන නාටක යන්න පැහැදිලි කරන්න.
09. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන නාටක ලියන්න.
10. ජන නාටකයක් වන සොකරි කතා පුවත කෙටියෙන් ලියන්න.
11. සොකරි නාට්‍යයේ ප්‍රධාන චරිත 4ක් ලියන්න.
12. සොකරි නාට්‍යයේ නාට්‍ය ධර්ම ලක්ෂණ ඇති බවට උදාහරණ සහිතව ලියන්න.
13. සොකරි නාට්‍යයේ රංග ශෛලිය ලියන්න.
14. සොකරි රඟ දක්වූ ප්‍රදේශ මොනවාද?
15. සොකරි නාට්‍යයේ අතීතයේ පැවැත්වූ පරමාර්ථ හා වර්තමානය එම ජන නාට්‍යය පැවැත්වීමේ අරමුණු මොනවාද?

- **4.2.2 කෝලම්**

16. කෝලම් යනු කුමක්දැයි හඳුන්වන්න.
17. කෝලම් පවතින ප්‍රදේශ මොනවාද?
18. කෝලම් කතා පුවත කෙටියෙන් ලියන්න.
19. කෝලම්වල විශේෂ ලක්ෂණ මොනවාද?
20. කෝලම් රංග භූමිය රූප සටහනක් මගින් නම් කරන්න.
21. කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ ලියන්න.
22. කෝලම් රංග ශෛලිය ලියන්න.
23. කෝලම් නාට්‍යයෙහි නාට්‍ය ධර්මී ලක්ෂණ ඇති බවට උදාහරණ සහිතව ලියන්න.